30.03.2018

# ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය
# ගෘහ නොවන ජලසම්බන්ධනයක් ලබාගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය

**ඉතා වැදගත් :- ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කිරීමට පෙර උපදෙස් පත්‍රිකාව සම්පූර්ණයෙන් කියවන්න.**

1. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම : (සිංහලෙන් පුරවන්න.)

   (සමාගමක් නම් අධ්‍යක්ෂකගේ/ ව්‍යාපාරයක් නම් අයිතිකරුගේ/ රාජ්‍ය ආයතනයක් නම් එහි ප්‍රධානියාගේ හෝ බලයලත් නිලධාරී)

   ........................................................................................................................................ පූජ්‍ය/ මයා/ මෙනවිය.

   (ii) මුලකරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින් පුරවන්න.) : Rev/ Mr./ Mrs./ Miss.

   තනතුර
   මුලකුරු සමඟ නම
   ආයතනයේ/ ව්‍යාපාරයේ නම

   (iii) ජාතික හැඳුනුම්පත් අංකය / රියදුරු බලපත්‍ර අංකය/ විදේශ ගමන් බල පත්‍ර අංකය :

2. ජලසම්බන්ධනය අවශ්‍ය වන ස්ථානයේ ලිපිනය :

   (i) සිංහලෙන්

   ව්‍යාපාරය/ ආයතනය අංකය ..................................................

   අතුරු පාර ..................................................

   ග්‍රාමීය ප්‍රධාන පාර ..................................................

   නගරය ..................................................

   (ii) ඉංග්‍රීසි කැපිටල් අකුරින්

   (iii) ග්‍රාම නිලධාරී කොට්ඨාශය හා අංකය　　　ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය　　　දිස්ත්‍රික්කය

3. ලිපි යැවිය යුතු ලිපිනය ..............................................................................................................................

   ..............................................................................................................................

   දුරකථන අංකය : ව්‍යාපාරය/ ආයතනය :............................ ජංගම :.................................. ඊ මේල් :................................ ..............

4. (a) සමාගමක් නම් සමාගම ලියාපදිංචි කිරීමේ සහතිකයෙහි/ ව්‍යාපාරයක් නම් ව්‍යාපාර නාම සහතිකයෙහි/ රජයේ ආයතනයක් නම් බලය පැවරීමේ ලිපියෙහි/ කොන්ත්‍රාත්කරු නම් ජල සැපයුමට අදාල ආයතනයෙන් ගත් ලිඛිත අවසර ලිපියෙහි සහතික කල පිටපත/ අමුණා ඇත. (අදාල නැති වචන කපා හරින්න.)

   (b) අයදුම්කරු ජල සම්බන්ධනය අවශ්‍ය කරන ස්ථානයේ අයිතිකරු වේ./ නොවේ.

   (නොවේ නම් උපදෙස් බලන්න.)

5. ඉල්ලා සිටින ජල සම්බන්ධන වර්ගය : රජයේ/ වාණිජ්‍ය/ කර්මාන්ත/ ආගමික/ වෙනත් .......................................................................................

6. (i) පාරිභෝගික කටයුතු සඳහා නම් කරනු ලබන බැංකුව : ........................................................... ගිණුම් අංකය : ...........................................................

   **(කෙටි පණිවුඩ (SMS) මගින් ගෙවීම් කටයුතු කිරීමට බලාපොරොත්තු වන පාරිභෝගිකයන් සඳහා පමණි.)**

7. අවශ්‍ය කරන ජල ප්‍රමාණය දිනකට ලීටර් (දළ වශයෙන්) ...........................................................

8. (i) මෙම ස්ථානයට මීට පෙර ජල සම්බන්ධනයක් ලබාගෙ　　තිබේ නම්, ගිණුම් අංකය:　　වර්ගය/ ප්‍රභේදය:

9. ජල නල එළීම සඳහා කානු කපා දීම (ජල මනුව දක්වා) අයදුම්කරු සිදුකරන්නේ ද ? ඔව්/ නැත. ("නැත" නම් උපදෙස් බලන්න.)

10. ඔබ ආයතනය සඳහා එකතු අගය බදු (VAT) හෝ සරළීකරණය කරන ලද එකතු කල අගය බදු (SVAT) සඳහා වන ජලබිල්පතක් අවශ්‍ය නම් සරළීකරණය කරන ලද බදු අංකය හා හෝ එකතු කල අගය බදු අංකය සඳහන් කරන්න. (කරුණාකර ලියාපදිංචි සහතිකවල පිටපත් ඉදිරිපත් කරන්න.)

**අයදුම්පත භාරගත් බවට සනාථ කර පාරිභෝගිකයාට නිකුත් කරන ලදුපත**

ඔබගේ ජල සම්බන්ධන ඉල්ලුම්පත්‍රයේ ලියාපදිංචි අංකය ...................................... වේ. මෙම අයදුම්පත්‍රය භාරගැනීම ඔබ වෙත ජල සම්බන්ධනයක් ලබාදීමට ස්ථිර සහතිකයක් නොවන බව කරුණාවෙන් සලකන්න. ඔබගේ ජල සම්බන්ධන පිළිබඳ විස්තර විමසීමේ දී ලියාපදිංචි අංකය සඳහන් කරන්න.

ඉල්ලුම්කරුගේ නම ............................................................... ඉල්ලුම්පත්‍රය භාරගත් දිනය ...........................................

11. ජල සම්බන්ධනය අවශ්‍ය ස්ථානය සොයා ගැනීම සඳහා අවශ්‍ය සම්පූර්ණ විස්තර සහිතව ස්ථානයට ළඟා විය හැකි මාර්ගය කටු සටහනකින් දක්වන්න.

යාබද පරිශ්‍රයේ ජල සම්බන්ධනයක් තිබේ නම් එහි ගිණුම් අංකය : ................................................................................

මෙම අයදුම්පතෙහි දක්වා ඇති ස්ථානයට ජල සම්බන්ධනයක් ලබාගැනීම සඳහා ඊට අනුකූල උපදෙස් මාලාව කියවා හොඳින් තේරුම්ගත් අතර අයදුම්පතෙහි සඳහන් කල සීමාව සියළුම කරුණු සත්‍ය තොරතුරු බවට සහතික කරමි.

දිනය : ................................................................. ....................................................................

**අයදුම්කරුගේ අත්සන**

30.03.2018

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

1. නිකුත් කළ දිනය
2. නිකුත් කළ ස්ථ
3. ලියාපදිංචි අංකය

**<u>ලබාදුන් ජල සම්බන්ධනයේ විස්තර</u>**

4. ගිණුම් අංකය
5. ප්‍රභේදය
6. මීටරයේ වර්ගය (Mater Type)
7. මීටර් අංකය
8. ජල සැපයුමෙහි ප්‍රමාණය
9. මීටරයේ ප්‍රමාණය
10. චක්‍රය (Cycle )
11. ජල සැපයුම දුන් දිනය
12. ජල සැපයුම දුන් දිනයට මීටරයේ කියවීම

........................................................................................... සේවක අංකය :...............................................

**ජල සම්බන්ධනය ලබාදුන් නිලධාරී/ සේවක මහතාගේ අත්සන**

30.03.2018

## ගෘහ නොවන සම්බන්ධනයක් සඳහා අයදුම්පත්‍රය පිරවීම සහ ජල සම්බන්ධන ලබාගැනීම පිණිස උපදෙස්

**A. <u>අයදුම්පත්‍රය පිරවීමේ දී පහත උපදෙස් අනුගමනය කරන මෙන් කාරුණිකව ඉල්ලමි.</u>**

1. (i) අයදුම්කරුගේ සම්පූර්ණ නම සිංහල භාෂාවෙන් පැහැදිලිව ලියන්න.

1. (ii) අයදුම්කරුගේ නම ඉංග්‍රීසි "කැපිටල් අකුරින්" පැහැදිලිව ලියන්න.

1. (iii) අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කරන්න. ජාතික හැඳුනුම්පත් අංකය නොමැති විට විදේශ ගමන් බලපත්‍රයේ හෝ රියදුරු බලපත්‍රයේ අංකය සඳහන් කරන්න.

| උදාහරණ :- | | |
|---|---|---|
| නම් | DIRECTOR<br>A.B. AND COMPANY LTD | සීමාසහිත හෝ සීමාසහිත නොවන සමාගමක් |
| | OFFICER IN CHARGE<br>POLICE STATION | රජයේ ආයතන |
| | A.C.DE SILVA | ඒක පුද්ගල හෝ හවුල් ව්‍යාපාර |

2. ජල සම්බන්ධනය අවශ්‍ය කරන ස්ථානයේ ලිපිනය, ග්‍රාම නිලධාරී කොට්ඨාශ අංකය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, දිස්ත්‍රික්කය සඳහන් කරන්න.

3. ලිපි යැවිය යුතු ස්ථානයේ ලිපිනය නිවැරදිව සඳහන් කරන්න. ජල සම්බන්ධනය අයදුම්කරන්නාගේ ආයතනික දුරකථන අංකය, ජංගම දුරකථන අංකය, ඊ මේල් ලිපිනය (තිබේ නම් පමණක්) සඳහන් කරන්න.

4. (a) සමාගම/ ව්‍යාපාරය ලියාපදිංචි සහතිකයෙහි සහතික කළ පිටපතක් ඉදිරිපත් කරන්න. (Form 48), රජයේ ආයතනයක් නම් බලය පැවරීමේ ලිපියද, කොන්ත්‍රාත්කරු නම් ජල සැපයුම ලබාගැනීමට අදාල ආයතනයෙන් ලබාගත් ලිඛිත අවසර ලිපිය ද ඉදිරිපත් කරන්න.

   (b) අයදුම්කරු ජල සම්බන්ධනය අවශ්‍ය කරන ස්ථානයේ නීත්‍යානුකූල අයිතිකරු නොවේ නම් අදාල ග්‍රාම සේවක හෝ සාමදාන විනිශ්චයකරුවකු විසින් සහතික කරන ලද අයිතිකරුගේ කැමැත්ත සහිත ලිපිය ඉදිරිපත් කළ යුතුය.

5. ජල සම්බන්ධනය අයදුම්කරන්නේ ආයතනයකට ද, ආගමික ස්ථානයකට ද, කර්මාන්ත ශාලාවකට ද යන්න පැහැදිලිව සටහන් කරන්න.

6. කෙටි පණිවුඩ (SMS) මඟින් ගෙවීම් කටයුතු කිරීමට බලාපොරොත්තු වන පාරිභෝගිකයන් පමණක් මෙම විස්තර පුරවන්න.

7. දිනකට අවශ්‍ය වේ යැයි සිතන ජල ප්‍රමාණය ලීටර් වලින් සඳහන් කරන්න.

8. මෙම ස්ථානයට මීට ඉහත දී ජල සැපයුම ලබාගෙන ඇත්නම් එම විස්තර අනිවාර්යයයෙන්ම ඉදිරිපත් කළ යුතුය.

9. ජල නල එලීම සඳහා කානු කපා දීම (ජල මනුව දක්වා) අයදුම්කරු සිදුකරන්නේ ද ? එසේ නම් "ඔව්" යනුවෙන් සඳහන් කරන්න. "නැත" යනුවෙන් සඳහන් කළ විට එය මණ්ඩලය විසින් සිදුකරන අතර ඊට අදාල මුදල ඇස්තමේන්තුවේ ඇතුලත් කරනු ඇත.

10. එකතු කළ අගය මත බදු (වැට්) බිල්පත් අවශ්‍ය නම් අදාල බදු අංක සඳහන් කර එහි ලියාපදිංචි සහතික වල පිටපත් ඉදිරිපත් කළ යුතුය.

11. ජල සම්බන්ධනය අවශ්‍ය ස්ථානය සොයා ගැනීම සඳහා පැහැදිලි රූප සටහනක් අමුණන්න. යාබද පරිශ්‍රයේ ජල සම්බන්ධනයක් තිබේ නම් එහි ගිණුම් අංකය සඳහන් කිරීම ඔබගේ ස්ථානය හඳුනාගැනීමට පහසුවක් වනු ඇත.

**ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කර ජලසම්පාදන මණ්ඩලය වෙත භාරදී ලදුපත ලබාගැනීමට කටයුතු කරන්න.**

**B. <u>ජල සම්බන්ධනය ලබාගැනීමේ දී පහත උපදෙස් අනුගමනය කරන මෙන් කාරුණිකව ඉල්ලමි.</u>**

1. ඔබගේ අයදුම්පත්‍රය අනුව මණ්ඩලය විසින් ඇස්තමේන්තුවක් සහිත ගෙවීම්පත, ජල සම්බන්ධන ලබාදීමේ දී සිදුවන මාර්ගය පළුදු කිරීම සම්බන්ධ විස්තර ඇතුලත් පත්‍රිකාව, ජල සම්බන්ධනය ලබාගැනීමේ දී මණ්ඩලය සමඟ එළඹිය යුතු ගිවිසුම් පත්‍රිකාව ඔබවෙත ලබාදෙනු ඇත.

   - ජල සම්බන්ධනය ලබාගැනීම සඳහා මණ්ඩලය වෙත ගෙවිය යුතු මුදල අදාළ වවුචරයේ සඳහන් ස්ථානයට ගෙවිය යුතුය.
   - මාර්ගය පළුදු කිරීම සම්බන්ධ විස්තර ඇතුළත් පත්‍රිකාව අදාල මාර්ගය නඩත්තු කරන ආයතනය වෙත ඉදිරිපත් කර මාර්ගයට සිදුවන හානි සඳහා ගෙවිය යුතු මුදල එම ආයතනය වෙත ගෙවිය යුතුය.

**ඉහත ගෙවීම් සිදුකර අදාල ගෙවීම් පත්‍රිකාව පළුදු කිරීම සඳහා අදාල මාර්ගය නඩත්තු කරන ආයතනය ලබාදුන් අවසර පත්‍රිකාව මණ්ඩලයේ අදාල කාර්යාල වෙත ඉදිරිපත් කළ යුතුය.**

2. ජල සම්බන්ධනය ලබාගැනීමේ දී මණ්ඩලය සමඟ එලඹිය යුතු ගිවිවිසුම් අත්සන් කිරීම සඳහා අදාල ජල පාරිභෝගිකයා නොපැමිණෙන්නේ නම්, සාමදාන විනිශ්චකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු විසින් සහතික කර හා සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරිපිට අත්සන් කර මණ්ඩලයේ අදාල කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය.

3. ජල සම්බන්ධනය ලබාගැනීමේ දී ආපසු ගෙවනු ලබන තැන්පත් මුදලක් ගෙවිය යුතුය. (මෙම මුදල අදාල සැපයුම්කරු ජල සැපයුම අවශ්‍ය නොවන අවස්ථාවක ජල සැපයුම ප්‍රධාන නලයෙන් විසන්ධි කර ගිණුම් අවලංගු කර ආපසු ලබාගත හැක.)

4. ජල සම්බන්ධ ලබාදෙනුයේ පිවිසුම් මාර්ගය ඔස්සේය. වෙනත් ඉඩමක් හරහා ලබානොදේ.

5. ජල පාරිභෝගිකයාගේ අදාල අයුරින් හා තාක්ෂණ හැකියාව මත ජල සම්බන්ධනයේ ප්‍රමාණය තීරණය කෙරේ, ජල මනුව සවිකිරීම සඳහා අවශ්‍ය කරනා කුළුණ ඔබ විසින් ඉදිකර ගත යුතුවේ. මේ සඳහා උපදෙස් අදාල කාර්යාලය මඟින් ලබාදෙනු ඇත.

6. සීමාසහිත/ සීමාසහිත නොවන සමාගම් වෙනුවෙන් ජල සම්බන්ධන ලබාගැනීමේ දී අධ්‍යක්ෂකවරුන් දෙදෙනෙකු විසින් ගිවිසුම අත්සන් කර නිල මුද්‍රාව සමඟ ඉදිරිපත් කළ යුතුයි. හවුල් ව්‍යාපාරයක් හෝ ඒක පුද්ගල ව්‍යාපාරයක් නම් හවුල්කරුවන් හෝ අයිතිකරුවන් විසින් ගිවිසුම අත්සන් කළ යුතුය. ගිවිසුම අත්සන් කිරීමේ දී සමාගම් ලියාපදිංචි කිරීමේ සහතිකය, ව්‍යාපාර නාම සහතිකය (Form 48) ඉදිරිපත් කළ යුතුය.  රජයේ ආයතනයක් නම් බලයලත් නිලධාරියෙකු අත්සන් කළ යුතුය. බලය පැවරීමේ ලිපියද ඉදිරිපත් කළ යුතුය.

7. ජල සම්බන්ධන ඉල්ලා සිටින්නේ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරු නම් එම ඉල්ලීමට අදාල ආයතනයේ ලිඛිත අනුමැතිය තිබිය යුතුය.

8. යම් හෙයකින් ඔබ විසින් ඉල්ලුම් කරන ලද ජල සම්බන්ධනය තාක්ෂණික හේතුවක් මත ලබාදිය නොහැකි නම් ඒ බව අයදුම්පත ලැබී දින 14 ක් ඇතුළත ඔබ වෙත  දැනුම් දීමට කටයුතු කරනු ඇත.

9. මේ සම්බන්ධව ඔබට අමතර ගැටළුවක් වේ නම් ලදුපතෙහි සඳහන් දුරකථන අංකයට අමතා වැඩ විස්තර දැනගැනීමට කාරුණික වන්න.

10. ගිවිසුම අත්සන් කිරිමේ දී ගෘහ නොවන පාරිභෝගිකයන් විසින් B හා C කොටස පමණක් නිසි පරිදි පුරවා අත්සන් කළ යුතුය.